ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2010

----------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

-----------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 ප්‍රකාරව 2009 වර්ෂයේදී එකතුව රු.442,966 ක් වූ පෙර වර්ෂ වෙනුවෙන් වූ ගැලපුම්, සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම්වලට ගැලපිය යුතු වුවත්, එය පෙර වර්ෂ ගැලපුම් ගිණුමෙහි දක්වා පසුගිය වර්ෂයේ ලාභාලාභ ගිණුමෙහි සමුච්චිත ශේෂයට ගලපා තිබුණු අතර 2010 දෙසැම්බර් 31 දින වන විටත් එය නිවැරදි කර ගෙන නොතිබුණි.

## 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරනවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පණත 19 (3) වගන්තිය | අදාල නියමයන් අනුව අධිකාරිය විසින් තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවිය යුතු බවත් තාක්ෂණ සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කරන ලද හෝ ලැබෙන සියළු මුදල් එම අරමුදලට බැර වියයුතු බව දක්වා තිබුණද, එම නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණ. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (i) 5.1.3 වගන්තිය | අධිකාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ හා යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික අයවැයක් පිළියෙල කොට සෑම ගිණුම් වර්ෂයක් ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රජයේ මුදල් රෙගුලාසි | |
| මු. රෙ. 133 (1) (අ) | විධිවිධාන ප්‍රකාරව, අධිකාරයේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,799,967 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.838,478 ක අතිරික්තයක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු.2,638,445 ක පිරිහීම සඳහා පුනරාවර්තන ප්‍රදාන රු.3,768,000 කින් අඩුවීමත්, මුළු වියදම රු.7,705,660 කින් වැඩි වීමත් බලපා තිබුණි.

### 2.1.2 මූල්‍ය තත්ත්වය

----------------

අධිකාරියේ ස්කන්ධය රු.3,918,079 කින් වර්ධනය වී තිබුණු අතර, ඒ සඳහා කාරක ප්‍රාග්ධනය රු.5,183,476 කින් වර්ධනය වීමත්, ආරම්භක සමුච්චිත අලාභය රු.7,152,042 කින් අඩුවීමත් බලපා තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 2.2.1. කාර්ය සාධනය

-----------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව කාර්ය මණ්ඩල වියදම් රු.2,690,343 කින්ද, ගමන් වියදම් රු.519,078 කින්ද ඇතුළුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ මුළු වියදම රු.7,705,660 කින් ඉහළ ගොස් තිබුණද 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන පනතින් ස්ථාපිත පහත දැක්වෙන කාර්යසාධන අරමුණු ඉටු කර ගැනීමට සම්පත් යොදවා ඇති ආකාරය තහවුරු කිරීමට කළමනාකාරත්වය අපොහොසත් වී තිබුණි.

(අ) ව්‍යවසාය සංවර්ධන, දිරිගැන්වීම්, ප්‍රවර්ධනය පහසුකම් සැලසීම තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය තහවුරු කිරීම.

(ආ) විදෙස් වෙළඳපොල ජයග්‍රහණ අත්පත් කර ගැනීම.

(ඇ) කර්මාන්ත හා කෘෂිකර්මාන්ත වෙළඳාම සංවර්ධනයට ඵලදායී ලෙස සහායවීම.

(ඈ) තාක්ෂණික නිපුණතා සහිතව මානව ප්‍රාග්ධනය සංවර්ධනය තුලින් ජනතා අභිවෘද්ධිය සැලසීම.

(ඉ) සංවර්ධන අවශ්‍යතා සඳහා යටිතල පහසුකම් සැලසීම.

(ඊ) ව්‍යවසාය සංවර්ධන සහ මෙහෙයුම් සඳහා අවශ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම.

(උ) සංවර්ධන හා පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

### 2.2.2. ගොඩනැගිලි කුලී

-------------------

2009 දෙසැම්බර් 31 දිනට රු.6,313,564 ක් වූ උපචිත ගොඩනැගිලි කුලිය ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය මත කපා හැර තිබුණි.

2.2.3. අයවැය පාලනය

------------------

2010 වර්ෂයේ තථ්‍ය වියදම හා අයවැයගත වියදම අතර බොහෝ විචලතාවයන් දක්නට තිබුණු බැවින් අධිකාරියේ අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කළමනාකාරිත්වය අපොහොසත්වී තිබුණු බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය